# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2115/50 – 2019 මාර්තු 22 වැනි සිකුරාදා – 2019.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/125.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (සේවකයින් තිදෙනෙක් වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

යුනිවෙලා (ප්‍රයිවට්) ලිමිටඩ්, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කොග්ගල, හබරාදූව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

1A – G 29713 – 16 (2019/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128, එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/125.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (සේවකයින් තිදෙනෙක් වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

යුනිවෙලා (ප්‍රයිවට්) ලිමිටඩ්, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කොග්ගල, හබරාදූව.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''යුනිවෙලා ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ සේවය කළ සේවකයින් වන එල්. දිනේෂ් නුවන් කුමාර ලම්බියස්, බී. ඒ. ඩී. යුරේෂ් හසංක රූපසිංහ සහ ලක්ෂාන් ගුණසේකර යන තිදෙනාගේ සේවය සේවායෝජක සමාගම විසින් එම සේවකයින් සේවය අත්හැර ගියා සේ සළකමින් අවසන් කිරීම නිසා අසාධාරණයක් සිදු වී තිබේ ද ? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමි වියයුතු සහන මොනවා ද ? යන්න පිළිබඳව වේ''.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 - 192

මගේ අංකය: IR/COM/02/2018/197.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

මඩුල්සිම ප්ලාන්ටේෂන් පීඑල්සී, හිඟුරුගම සංකීර්ණය, බදුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30, සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2018/197.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

මඩුල්සිම ප්ලාන්ටේෂන් පීඑල්සී, හිඟුරුගම සංකීර්ණය, බදුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික** ආරාවුලට **හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''මඩුල්සිම ප්ලාන්ටේෂන්ස් (පීඑල්සී) මගින් පාලනය වන වතුවල ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස සේවය කරන ලංකා වතු සේවා සංගමයට අයත් සාමාජිකයන්ට වසර 25ක් තිස්සේ කම්කරුවන් දිනකට නෙලාගත යුතු දළු ප්‍රමාණයට වඩා දළු නෙලීමේදී ගෙවනු ලබන

දිරි දීමනාව ආයතනය විසින් ඒකපාර්ශිකව අහිමි කිරීම නිසා එම සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 – 193

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.